**ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (ආ) (ii) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු සියළුම වත්කම් තක්සේරු කර වටිනාකම ගිණුම්ගත කළ යුතුය. | 1.6.1(අ)(iii) |
| 1.6.1(ආ)(iv) | ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පවරා ඇති සියළුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1(අ)(iv) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ වෙනත් වැය ශීර්ෂයන් වෙතින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබුණු වටිනාකම රු.411,264 ක් වූ මෝටර් රථ හා යන්ත්‍ර උපකරණ නිත්‍යානුකූලව පවරා නොගෙන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා අධිකරණ අමාත්‍යාංශයෙහි වැය ශීර්ෂය යටතේ මිලදී ගන්නා ලද වත්කම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් යටතේ ඉන්වෙන්ට්‍රිගත කිරීමට අවසර දී ඇත. | නෛතිකව පවරා දුන් වත්කම් පමණක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සිගාස් BOS සාරාංශ වාර්තාව අනුව වත්කම් කාණ්ඩ 03 ක වටිනාකම් එකතුව රු.207,863,520 ක් වූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබා ගත් වත්කම් වටිනාකම් පිළිබඳ තොරතුරු අනුව වටිනාකම රු.32,366,561 ක් වූයෙන් රු.175,496,959 ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තොරතුරු සැපයීමේදී සිදුවී තිබූ අතපසුවීම් හේතුවෙන් මෙම වෙනස්කම් සිදුවී ඇත. | සිගාස් සාරාංශ වාර්තාව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වත්කම් වටිනාකම් සමාන විය යුතුය. |
| (iii) | කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පියදිගම ශිෂ්‍ය බළ ඇණිය ගොඩනැගිල්ල හා මාදම්පාගම නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල තක්සේරු කර වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත් එම වාර්තා ලැබී නොමැති බැවින් වටිනාකම ගිණුම්ගත කර නොමැත. | වත්කම් තක්සේරු කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කර වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |
| (iv) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පවරා දී තිබූ වසා දමන ලද පාසල් 78 ක ඉඩම් අක්කර 107 ක් හා ගොඩනැගිලි 125 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කළ හැකි පාසල් 31 හි පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | වත්කම් තක්සේරු කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කර වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |

**(ආ) අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2006 වර්ෂයේ සිදුවී තිබුණු චෙක්පත් වංචාවක් හේතුවෙන් ඉදිරියට ගෙන එන ලද නොපියවූ ශේෂය 2022 දෙසැම්බර් 31 දිනට රු.115,536 ක් විය. | වාරික වශයෙන් අදාළ පුද්ගලයාගෙන් අය කර ගනු ලැබේ. | හිඟ මුදල කඩිනමින් අය කර ගෙන නොපියවූ ශේෂ නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ 26 කින්, දෙපාර්තමේන්තු 16 කින් හා වෙනත් ආයතනයකින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එකතුව රු.3,347,788,862 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර රු.3,184,403,320 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.163,385,542 ක් ප්‍රතිපාදන ඉතිරිකරගෙන තිබුණි. | නිලධාරීන්ගේ ක්ෂේත්‍ර දීමනා විවිධ හේතූන් මත අවම වීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ලැබෙන ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය කළ යුතුය. |

### 2.2 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අධිකාර බලය නොමැති ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු 2019 දෙසැම්බර් 10 දින සිට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සේවය කර තිබුණි. ආයතන සංග්‍රහයේ XXX වැනි පරිච්ඡේදයේ 1.3 වගන්තිය අනුව ලේකම්වරයාගේ අවසරය කල් ඇතිව ලබා ගැනීමකින් තොරව 2019 දෙසැම්බර් මස සිට 2021 අප්‍රේල් මාසය දක්වා සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු ලෙස එකතුව රු.612,692 ක්ද, මාර්ග සංවර්ධන අධිකාරියේ | 2020 ඔක්තෝබර් 21 සිට 2021 ජූලි මස දක්වා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ගෙවන ලද වැටුප මසක් ඇතුළත ගෙවන ලෙස අදාළ සමෘද්ධි සංවර්ධන නිලධාරියා වෙත දන්වමින් 2023 මාර්තු 14 දින ලිපියක් යොමු කරන ලදී. | අවිධිමත්ව හා නිසි අනුමැතියකින් තොරව කරන ලද ගෙවීම් නැවත අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

සභාපතිවරයා වශයෙන් එම කාල පරිච්ඡේදයට අදාළවම රු.1,165,625 ක්ද වැටුප් හා දීමනා වශයෙන් අවිධිමත්ව ලබාගෙන තිබුණි.

**(ආ) ගෙවීම් සඳහා සම්මත නොකළ වවුචර්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් මසක් වයසැති ගැමි කිකිළි පැටවුන් 1,822 ක් සැපයීම වෙනුවෙන් රු.865,450 ක් ගෙවීම සඳහා 2022 අගෝස්තු 30 දිනැති චෙක්පත පිළියෙල කර තිබුණි. 2023 මාර්තු 23 වන විගණන පරීක්ෂණ දිනය වන විටත් කිකිළි පැටවුන් සපයා නොතිබුණු බැවින් මාස 07 කට ආසන්න කාලයක් චෙක්පත අත රඳවාගෙන තිබුණි. මුදල් රෙගුලාසි 137(5) ප්‍රකාරව සැපයීම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී ඒවා පරීක්ෂාකොට නිවැරදි ලෙස භාරගෙන තිබෙන බව සහතික වීමකින් තොරව සැපයුම් සඳහා ගෙවීම් කිරීම අනුමත නොකළ යුතු වුවද ඊට පටහැනිව කටයුතු කර තිබුණි. | ව්‍යාපෘතියේ කොටසක් නිම කර ඇති අතර වර්තමාන රටේ තත්ත්වයට මෙම ව්‍යාපෘතිය ඉතා වැදගත් වූ බැවින් ඉදිරියේදී මෙම කුකුළුපැටවුන් සැපයීම සඳහා සැපයුම්කරු පොරොන්දු වී ඇත. එබැවින් මෙම මුදලට චෙක්පතක් ලියා රඳවා ගන්නා ලදී. | සත්‍ය ලෙසම භාණ්ඩ ලද බව සහතික කර ගැනීමෙන් පසුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ට අදාළව රු.239,462,961 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පතු නිදහස් කිරීම හෝ නිදහස් කර නොගන්නේ නම් ආදායමට ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දින චමිලා සෝමරත්න පදනම විසින් මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදි කිරීම සඳහා ලබා දුන් රු.10,000,000 ක මුදල් 2023 මාර්තු 31 දින වන විටත් අදාළ ඉදි කිරිමේ කටයුතු සඳහා යොදා නොගෙන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදි කිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොමැති බැවින් එම මුදල තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇත. | යම් විශේෂිත කාර්යයක් සඳහා ලද මුදල් අදාළ කාර්යය සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක් මගින් ක්‍රියාත්මක කරන ලද ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, පළාත් පාලන කොට්ඨාශ සංවර්ධනය සහ ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භෞතික ඉලක්කයන් පිළිවෙලින් 9,616 ක්, | 3/2022 ජාතික අයවැය චක්‍රලේඛය මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටවීම නිසා අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගත නොහැකි වී ඇත. | ක්‍රියාකාරී සැලැස්ම මගින් සැලසුම් කරන ලද ව්‍යාපෘති ඒ ආකාරයට ඉටු කිරීමටත්, එසේ නොවන විට සැලසුම් සංශෝධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

3,666 ක් සහ 3,081 ක් වුවද, එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පිළිවෙලින් 2,160 ක්, 771 ක් සහ 448 ක් විය. ඒ අනුව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 7,456 ක් ද පළාත් පාලන කොට්ඨාශ සංවර්ධන ව්‍යාපෘති 2,895 ක් ද ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති 2,633 ක් ද ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.2 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේදී ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.3,154,877,678 ක් වූ ආසන 2000 ශ්‍රවණාගාරය ඉදි කිරිමට අදාළව 2023 මාර්තු 16 දින වන විට ව්‍යාපෘති උපදේශක විසින් නිර්දේශිත මුළු බිල් පත් වටිනාකම රු.966,723,463 ක් වී තිබුණි. මෙය ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 30 ක් වී තිබුණද, විගණන දිනය වූ 2022 මාර්තු 24 දින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 15 ක තරම් අඩු මට්ටමක පැවති අතර එදිනට රු.195,170,420 ක් ගෙවීම් කර තිබුණි. ඒ වන විට කොන්ත්‍රාත්කරුට ලබා දී තිබූ රු.426,330,247 ක අත්තිකාරම් මුදල් ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ කටයුතු නවතා දමා ඇති අතර අත්තිකාරම් බැඳුම්කර මෙන්ම රක්ෂණාවරණයන්ද කල් ඉකුත්වී තිබුණු බැවින් අය කර නොගත් අත්තිකාරම් මුදල් තවදුරටත් අය කර ගැනීමේ අවදානමක් පැවතුණි. | ව්‍යාපෘතියේ ඉදි කිරීම් තාවකාලිකව නවතා ඇති බවත් එහි කාලය දිර්ඝ කිරීම් සහ බැඳුම්කර කාලය දිර්ඝ කිරීම ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සිදු කළ යුතු බවත් දන්වා ඇත. | ගෙවන ලද අත්තිකාරම් මුදල් ආපසු අය කර ගැනීමටත් මෙතෙක් කර ඇති ඉදි කිරීම් සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම්වලදී විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවද, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.19,227,845 ක් වූ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් අවස්ථා 11 ක දී ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගන්නා බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් දළ වටිනාකම රු.1,000,000 ක් වූ කැබ්රථයක් 2020 මාර්තු 10 සිට 2022 ජූලි 20 දින දක්වා කාර්යාලයේ ගරාජය තුළද, විගණිත දිනය වූ 2023 මාර්තු 27 දක්වා බටගංවිල සංචාරක බංගලාව පරිශ්‍රයේද ගාල් කර දිරාපත්ව තිබුණි. | මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය යටතේ ඉදිරියේදී අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | භාවිතයට නොගන්නා වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ඉදි කිරීමට රජයට ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා 38(අ) අතුරු විධාන ආඥාව 2001 ජූලි 20 දින නිකුත් කර තිබුණද, වන්දි මුදල් ගෙවා තිබුණේ 2020 නොවැම්බර් 18 දින දීය. මේ හේතුව නිසා රු.10,790,740 ක පොළී මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | මෙම පොළී මුදල් ගෙවීම සඳහා තවමත් ප්‍රතිපාදන වෙන් කර නොමැත. | ප්‍රමාදයන් හේතුවෙන් ගෙවීමට සිදුවන නිෂ්කාර්ය වියදම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධිත සමෘද්ධි බැංකු සංගම් 4 ක් මගින් සමෘද්ධිලාභීන් වෙත ලබා දුන් ණය මුදලින් 2023 පෙබරවාරි 28 වන විට ණයලාභීන් 197 ක ගේ රු.11,287,644 ක මුදලක් කල් පසු වූ ණය ලෙසද, ණයලාභීන් 174 ක ගේ රු.7,602,302 ක් බොල්ණය ලෙසද, ප්‍රතිලාභීන් විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු අතුරින් පුද්ගලයන් 3,026 ක ගේ රු.552,845 ක් වූ තැන්පත් අක්‍රීය තැන්පතු ලෙසද හඳුනාගෙන තිබුණි. | කල් පසු වූ ණය අය කර ගැනීම සඳහා සහ බොල් ණය අය කර ගැනීම සඳහා මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ණය මුදල් කඩිනමින් අය කර ගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කළ යුතු අතර බොල්ණය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් ඉටු කර ගත හැකිව තිබූ කාර්යයන් 12 ක් අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටු කර තිබුණේ කාර්යයන් 02 ක් පමණි. 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම පද්ධතිය මගින් සියළු කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා නිලධාරීන් පුහුණු කර නොතිබුණි. | මේ සම්බන්ධව කිසිදු පුහුණු වැඩසටහනක් නිලධාරීන්හට ලබා දි නැති අතර ලබා දී ඇති එකම පරිගණකයේ තාක්ෂණික දෝෂයක් මත යථාවත් කිරීමට සිදුවී ඇත. | ස්ථාපිත කර ඇති කළමනාකරණ තොරතුරු පද්ධතිය උපරිම කාර්යක්ෂමතාවයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2004 දෙසැම්බර් 26 දින සිදුවූ සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූවන්ට ඔප්පු ලබා දීමේදී අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ නිවාස ලාභීන් 319 කින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඔප්පු ලබා දී තිබුණේ 105කට පමණි. | ඉතිරි ඔප්පු ලබා දීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ඉටු කරමින් පවතී. | මෙම කටයතු කඩිනමින් නිම කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ආයතනයේ කාර්ය මණ්ඩලයෙහි අතිරික්ත නිලධාරීන් 604 දෙනෙකු විධිමත් පරිදි අනුමත කර ගැනීමකින් තොරව සේවයෙහි නියුක්ත කර තිබුණි. | මේ පිළිබඳව ආයතන අධ්‍යක්ෂ දැනුවත් කර ඇත. | පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමටත් අතිරික්ත නියමානුකූල කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |